# වාහල්කඩ



**ධනුද්ධර**

ගෙදර ගියොත් අඹු නසී මඟ හිටියොත් තෝ නසී

# ආණ්ඩුවත් විපක්ෂයත් දෙකම පඹ ගාලක

එක්සත් ජාතික පක්ෂය ප්‍රමුඛ ආණ්ඩුවක හා ශ්‍රී ලංකා නිදහස් පක්ෂය ප්‍රමුඛ ආණ්ඩුවක අතර ඇති වෙනස සම්බන්ධයෙන් අපගේ මිතුරෙක් අපූරු කතාවක් කීවේය. එක්සත් ජාතික පක්ෂ ආණ්ඩුවක් පත්වූ දා සිටම ආණ්ඩුවත්, විපක්ෂයත්, ජනතාවත් සිතන්නේ එම ආණ්ඩුව කිසිදිනෙක බිඳ නොවැටෙන එකක් බවය. ශ්‍රී ලංකා නිදහස් පක්ෂය ප්‍රමුඛ ආණ්ඩුවක් පත්වූ දා සිටම ආණ්ඩුවේ අයත්, විපක්ෂයත්, ජනතාවත් සිතන්නේ මේ ආණ්ඩුව අද හෙටම කඩා වැටෙනු ඇතැයි යන්නය.

මෙය හාස්‍ය ජනක කතාවක් සේ පෙනුන ද ඒ තුළ සත්‍යයක් නැත්තේම නැත. ශ්‍රී ලංකා නිදහස් පක්ෂය සෑම විටකම ආණ්ඩු බලය ගන්නේ තවත් පක්ෂ ගණනාවකගේ සහය ඇතිවය. ඒ නිසා බලයට පත්වූ දා සිටම එක් එක් පක්ෂ අතර අර්බුද තිබේ. ඉන් රටට දෙන පණිවිඩය වන්නේ ආණ්ඩුව කඩා වැටීමට ආසන්න බවය. ආණ්ඩුවේ මැති ඇමතිවරුන් ද එසේ සිතන නිසා කටයුතු කරන්නේ විපක්ෂයට ගිය පසු කරන්නේ කුමක්ද යන්න සැලසුම් කිරීමය. ශ්‍රීලනිපය ප්‍රමුඛ සන්ධාන ආණ්ඩුව කිසිදු වැඩක් නොකරන බව පෙනී යන්නේ ඒ නිසාය.

කෙසේ වෙතත් මේ වන විට සන්ධාන ආණ්ඩුව බිඳ වැටීමේ මුව විටට පැමිණ තිබේ. ඒ යෝජිත උතුරු නැගෙනහිර ඒකාබද්ධ යාන්ත්‍රණය නිසාවෙනි. සුනාමියෙන් උතුරු නැගෙනහිර ප්‍රදේශවලට සිදුවූ හානි ප්‍රතිසංස්කරණය කිරීම සඳහා ඒකාබද්ධ යාන්ත්‍රණයක් සකස් කිරීමේ යෝජනාවට ජනාධිපතිනිය ද එකඟතාව එලකොට ඇතැයි දැන ගන්නට තිබේ. පසුගිය අප්‍රේල් 19 දා නෝර්වේ තානාපතිවරයාගේ නිවසේදී එරික් සොල්හයිම් මාධ්‍ය වෙත පවසා තිබුණේ ඒකාබද්ධ යාන්ත්‍රණය සම්බන්ධයෙන් 99%ක්ම ආණ්ඩුව හා එල්.ටී.ටී.ඊ සංවිධානය එකඟතාවකට පැමිණ ඇති බවයි. මැයි මස මුල් සතියේ ඊට දෙපාර්ශවයම අත්සන් තබනු ඇතැයි ද ඔහු එහිදී පවසා තිබේ. එසේ නොවුණහොත් ශ්‍රී ලංකාවට විදේශ ආධාර නොලැබී යනු ඇතැයි ද සොල්හයිම් අනතුරු අඟවා ඇත. ශ්‍රී ලංකාවට ආධාර දෙන රටවල රැස්වීම ලබන මැයි මස 15-16 දිනවල දී පැවැත්වීමට නියමිතය.

දැනට වාර්තා වී ඇති අන්දමට ඒකාබද්ධ යාන්ත්‍රණයේ ප්‍රධානත්වය දරණු ඇත්තේ ආණ්ඩුවේ, එල්.ටී.ටී.ඊ සංවිධානයේ හා මුස්ලිම් නියෝජිතයෙකු වශයෙන් තිදෙනෙකි. ඉන් පසු එක් එක් දිස්ත්‍රික්ක සඳහා දිසා ලේකම්වරයාගේ ප්‍රධානත්වයෙන් නියෝජිතයන් පත් කෙරෙනු ඇත. අම්පාර, වවුනියාව හා ත්‍රිකුණාමලය යන දිස්ත්‍රික්කවලට සිංහල, දෙමළ, මුස්ලිම් නියෝජිතයන් ද, මඩකලපුවට දෙමළ හා මුස්ලිම් නියෝජිතයන් පමණක් ද පත් කිරීමට නියමිත අතර, යාපනයට පත් කෙරෙණු ඇත්තේ එල්.ටී.ටී.ඊ නියෙජිතයන් පමණකි. එසේම උතුරු නැගෙනහිර ප්‍රතිසංස්කරණ කටයුතු සඳහා ලැබෙන විදේශ ආධාරවල භාරකරු වනු ඇත්තේ ලෝක බැංකුවයි.



රෙජිනෝල්ඩ් කුරේ මහතා ජනාධිපතිනිය සමග

මෙම යාන්ත්‍රණය මේ අන්දමට ක්‍රියාත්මක වුවහොත් ආණ්ඩුවෙන් ඉවත් වීමට ජනතා විමුක්ති පෙරමුණ තීරණය කර ඇතැයි දැන ගන්නට ඇත. ඒකාබද්ධ යාන්ත්‍රණය සම්බන්ධයෙන් ඩේලිමිරර් පුවත්පතට අදහස් දක්වන එම පක්ෂයේ ප්‍රචාරක ලේකම් විමල් වීරවංශ පවසා ඇත්තේ ඒකාබද්ධ යාන්ත්‍රණය බිහිවනු ඇත්තේ සන්ධාන ආණ්ඩුවක් යටතේ නොවන බවය.

ඇතැම් දේශපාලන විචාරකයන් පෙන්වා දෙන්නේ ඒකාබද්ධ යාන්ත්‍රණය සටන් විරාම ගිවිසුම ද ඉක්මවා යමින් එල්.ටී.ටී.ඊ සංවිධානයට බලතල ලබා දෙන බවකි. විශේෂයෙන්ම මුදල් බලය ලබා දීම ඔවුන්ගේ වෙනම රාජ්‍ය සංකල්පය තහවුරු කරන්නක් බව ඔවුහු පෙන්වා දෙති. එල්.ටී.ටී.ඊ සංවිධානය පසුගිය දිනෙක මඩකලපුවේ දී රජයේ වෘත්තීය පුහුණු අධ්‍යක්ෂවරයාව ඝාතනය කළ අතර, ප්‍රභාකරන්ගේ ඡායාරූපය තම කාර්යාලයේ එල්ලීම ප්‍රතික්ෂේප කළ තිරුක්කෝවිල් ප්‍රාදේශීය ලේකම්වරයා ද ඝාතනය කළෝය. මෙවැනි තත්වයක් තුළ එල්.ටී.ටී.ඊ සංවිධානයට ඒකාබද්ධ යාන්ත්‍රණයක් ද ලබා දුනහොත් ඔවුන් හමුදා පාලන ප්‍රදේශවල ද තම අණසක පතුරුවන්නට පටන් ගනු ඇතැයි 'ලංකාදීපයට' තීරු ලිපියක් ලියන තිසරනී ගුණසේකර මහත්මිය පෙන්වා දී තිබේ. එමඟින් උතුරු නැගෙනහිර තම පාලනයක් පවතින බව තහවුරු කරගන්නට එල්.ටී.ටී.ඊ සංවිධානයට අවස්ථාව හිමිවනු ඇතැයි ඇය වැඩිදුරටත් පෙන්වා දෙයි.

නැගෙනහිර පළාතේ මුස්ලිම් ජනතාවද මෙම ඒකාබද්ධ යාන්ත්‍රණයට දැඩි විරෝධය පලකර ඇත. නෝර්වේ සාම නියෝජිත එරික් සොල්හයිම් හමුවූ උතුරු නැගෙනහිර මුස්ලිම් සාම මණ්ඩලයේ සම්බන්ධීකරණ ලේකම්වරයා පවසා ඇත්තේ මුස්ලිම් ජනතාව සඳහා වෙනම යාන්ත්‍රණයක් අවශ්‍ය වන බවයි. යෝජිත ඒකාබද්ධ යාන්ත්‍රණය යනු අන්තර් පාලනය සඳහා වන දොරටුවක් බව පෙන්වා දී ඇති ඔහු එල්.ටී.ටී.ඊ සංවිධානයේ අන්තර් පාලනයක් යටතේ ජීවත් වීමට මුස්ලිම් ජනතාව අකමැති බව පෙන්වා දී තිබේ.

ඒකාබද්ධ යාන්ත්‍රණය ක්‍රියාත්මක කිරීමට ජනාධිපතිනිය පියවර ගතහොත්, ජනතා විමුක්ති පෙරමුණේ ඇමතිවරුන් පමණක් නොව ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේද ඇතැම් ඇමතිවරුන්, නියෝජ්‍ය ඇමතිවරුන් තම තනතුරුවලින් ඉල්ලා අස්වීමට සූදානමින් සිටින බව දැනගන්නට ඇත.

මෙම තත්වය හමුවේ ඒකාබද්ධ යාන්ත්‍රණය ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් යළි සලකා බැලීමට ජනාධිපතිනියට සිදුවනු ඇත. විශේෂයෙන්ම බස්නාහිර පළාත් ප්‍රධාන අමාත්‍ය රෙජිනෝල්ඩ් කුරේ මහතාට එරෙහිව එක්සත් ජාතික පක්ෂය ගෙනවිත් තිබෙන විශ්වාස භංග යෝජනාව පරාජය කිරීමට සහය ලබාදීමට ජනතා විමුක්ති පෙරමුණ ගෙන ඇති තීරණය තමන්ට කළ අනතුරු ඇඟවීමක් සේ ජනාධිපතිනිය සලකනු ඇත. මෙම විශ්වාස භංගය සම්බන්ධයෙන් ජනතා විමුක්ති පෙරමුණ සමඟ සාකච්ඡා කිරීමට ජනාධිපතිනිය තීරණය කළේ එනිසා විය යුතුය.

> එස්.බී දිසානායක සිරගත කිරීම උපයෝගී කරගෙන එවන් විරෝධයක් නිර්මාණය කිරීමට උත්සාහ කළ ද එය පුස්සක් වී ඇත.

ආණ්ඩුව පමණක් නොව, විපක්ෂය ද මේ අන්දමට අර්බුදකාරී තත්වයක මුහුණ පා සිටී. පළමු අර්බුදය වන්නේ ආණ්ඩුවට එරෙහිව දැඩි ජනතා මතයක් ගොඩනගා ගැනීමට නොහැකි වීමය. එස්.බී දිසානායක සිරගත කිරීම උපයෝගී කරගෙන එවන් විරෝධයක් නිර්මාණය කිරීමට උත්සාහ කළ ද එය පුස්සක් වී ඇත. සුනාමියෙන් විපතට පත් ජනතාවට නිවාස හා සහනාධාර ලබාදීම නිසි පරිදි සිදුවී නැතත් එය වලංගු වන්නේ ඊට අදාළ ජනතාවට පමණකි. මේ නිසා ඉදිරියේ එන ජනාධිපතිවරණයට විශ්වාසයකින් යුතුව මුහුණ දීම පිළිබඳ බරපතල ප්‍රශ්නයකට විපක්ෂ නායක රනිල් වික්‍රමසිංහ මුහුණ පා සිටී. මෙම තත්වය මත රනිල් වික්‍රමසිංහට එරෙහිව යළිත් වරක් එම පක්ෂය තුළින්ම විරෝධයක් මතුව තිබේ. එම විරෝධය උත්සන්න වී ඇත්තේ රනිල්, පක්ෂයේ ජ්‍යෙෂ්ඨ, පළපුරුදු ආසන සංවිධායකයන් වෙනුවට තමන්ට හිතවාදී තරුණ ආසන සංවිධායකවරුන් ගණනාවක් පත් කිරීම නිසාය.

පසුගිය කාලයේ එක්සත් ජාතික පක්ෂයේ මාධ්‍ය ප්‍රකාශක හා අධ්‍යාපන අමාත්‍යවරයා වූ කරුණාසේන කොඩිතුවක්කු වෙනුවට කඩුවෙල ආසනයට සුජීව සේනසිංහ නමැති තරුණ නීතිඥයෙකු පත්කොට ඇත. හිටපු අමාත්‍යවරයෙකු වන ඊ.එල් සේනානායකගේ පුත් මහනුවර වත්මන් නගරාධිපති කේසර සේනානායක වෙනුවට සෙංකඩගලට පත්කොට ඇත්තේ චන්දන සූරියබණ්ඩාර නම් හිටපු මාධ්‍යකරුවෙකි. ටී.එන්.එල් සේවයේ සිටි බුද්ධික පතිරණ, ස්වර්ණවාහිනියේ දිදුල බෝගහකුඹුර පිළිවෙළින් අකුරැස්සට හා හාලිඇලට පත්කොට ඇත. හිටපු අමාත්‍යවරයෙකු වන පී.බී

24 වන පිටුව